මගේ අංකය :- JSC/SPO/EB/2021(2023)

සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්/ මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ / අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

## උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2021

අංක 2088/26 හා 2018 සැප්තැම්බර් මස 11 වෙනි දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 10.10 හා 15.3.1 වගන්ති වල සහ "ඌ" පරිශිෂ්ඨයෙහි 01.4 වගන්තියේ දැක්වෙන කොන්දේසි හා විෂය නිර්දේශ අනුව අධිකරණ යතුරුලේඛක III වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය වලින් කොළඹ දී පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ යතුරු ලේඛක සේවයේ III ශ්‍රේණියේ 2021.12.31 දිනට පෙර පත්වීම් ලද නිලධරයන් පමණක් මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුස්සෝ වෙති.

- අධිකරණ යතුරුලේඛක සේවයේ III ශ්‍රේණියේ නිලධරයන් වසර 05 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

02. විභාගය පිළිබඳ විස්තර

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු |
|---|---|---|---|---|
| 01 | යතුරු ලියනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | විනාඩි 20 | 100 | 40 |

03. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | | කාලය |
|---|---|---|---|---|
| 01. | යතුරු ලියනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | (1) | යතුරු ලියනය (සිංහල) - දෙනු ලබන වචන 500ක ඡේදයක් විනාඩියකට වචන 25ක වේගයෙන් යතුරු ලියනය කිරීම | විනාඩි 20 |
| | | (2) | යතුරු ලියනය (දෙමළ) - දෙනු ලබන වචන 500ක ඡේදයක් විනාඩියකට වචන 25ක වේගයෙන් යතුරු ලියනය කිරීම | විනාඩි 20 |
| | | (3) | යතුරු ලියනය (ඉංග්‍රීසි) - දෙනු ලබන වචන 600ක ඡේදයක් විනාඩියකට වචන 30ක වේගයෙන් යතුරු ලියනය කිරීම | විනාඩි 20 |

(අයදුම්කරුගේ පත්වීම අනුව ඉහත (1), (2), (3) ප්‍රශ්න පත්‍ර අතරින් අදාල ප්‍රශ්න පත්‍රය තෝරා ගත යුතුය)

04. මෙම විභාගය පරිගණක භාවිතා කරමින් පැවැත්වීමට තීරණය කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය පරිගණක යන්ත්‍ර සපයනු ලැබේ.

05. සිංහල මාධ්‍යය අයදුම්කරුවන්ට තම අභිමතය පරිදි පහත සඳහන් අක්ෂර ක්‍රම (Font) වලින් එකක් භාවිතා කරමින් යතුරු ලියන පරීක්ෂණයට පෙනී සිටීමට අවස්ථාව සලසා ඇත.

i. Sandaya BOI
ii. Su-VijayaO
iii. Iskoola Pota

06. දෙමළ මාධ්‍යය අයදුම්කරුවන්ට තම අභිමතය පරිදි පහත සඳහන් අක්ෂර ක්‍රම (Font) වලින් එකක් භාවිතා කරමින් යතුරු ලියන පරීක්ෂණයට පෙනී සිටීමට අවස්ථාව සලසා ඇත.

i. Sharukeshi
ii. Kalaham
iii. Latha

07. ඉංග්‍රීසි මාධ්‍යය අයදුම්කරුවන්ට පහත සඳහන් අක්ෂර ක්‍රමය (Font) භාවිතා කරමින් යතුරු ලියන පරීක්ෂණයට පෙනී සිටීමට අවස්ථාව සලසා ඇත.

i. Times New Roman

08. මෙම පරීක්ෂණයෙන් සාමාර්ථයක් ලබා ගැනීම සඳහා අපේක්ෂකයින් 40%ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

09. පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකදු වුවත් ඉන්පසු වාර වලදී නිලධරයන් විසින් විභාගයට පෙනී සිටීමේදී රු. 250/- ක් විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. මීට ප්‍රථම මෙම විභාගය සඳහා ඉල්ලුම් කර ඉදිරිපත් නොවූ නිලධරයන් දෙවන වතාවට ඉදිරිපත් වන සේ සලකා විභාග ගාස්තු ගෙවා විභාගයට අයදුම් කළ යුතුය. කවර කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. මෙම විභාග ගාස්තු **අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්** නමින් මහජන බැංකුව, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම් අංක **297100199025039** ට බැර කර ලබා ගන්නා ලදු පත අයදුම් පත්‍රයේ අලවා එවිය යුතුය.

11. මේ සමග ඇති ආකෘති පත්‍රයට අනුව 11 ½ " X 8 ½ " ප්‍රමාණයේ ඝන කඩදාසියේ සකස් කොට සම්පූර්ණ කරන ලද අදාල නිලධරයන්ගේ අයදුම්පත්‍ර ඔබේ නිර්දේශය සමග <u>2023 අප්‍රේල් 28</u> වන දිනට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් මෙම කාර්යාලයට එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **<u>" අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක III වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2021"</u>** යනුවෙන් සඳහන් කළ යුතුය.

12. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර හා නිසි අයුරින් සම්පූර්ණ නොකළ අයදුම්පත්‍ර ද කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. මෙම ලිපිය ඔබ අධිකරණයේ අදාල සියලුම නිලධරයන්ට දැන්වීමට කටයුතු කරන්න.

පී.එම්.ටී.බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

පී.එම්.ටී. බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

අත්සන් කළේ / එච්.එස්.සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

2023 මාර්තු මස 27 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

**SPECIMEN APPLICATION FORM**

**Efficiency Bar Examination for Officers in Court Typist Grade III of the Court Management Assistants' Service – 2021**

---

01. Name:
    1:1 Name with initials Mr./Mrs./Miss:..............................................................
    (In block capital letters)
    1:2 Full Name: ...................................................................................................
    (In block capital letters)
    1:3 Full Name: ...................................................................................................
    (In Sinhala/Tamil)

02. National Identity Card Number: ...................................................................

03. Address:

    3:1 Permanent Address: ......................................................................................
    (In block capital letters)
    3:2 Official Address: ...........................................................................................
    (In block capital letters)

04. Contact Details
    4.1 Mobile No-: .............................................

05. Date of Birth: Date _________ Month __ ______Year_____

06. Personal File No: EA/PF/4/_____

07. Date of appointment to the post of Court Typist Grade III: ........................

08. Medium in which you sit for the examination:

    ☐

    (Denote with "S" for Sinhala, "T" for Tamil, "E" for English)

09. Please give details if you sat for the exam previously:

| Year | Subject |
|---|---|
| | I. |

10. Subject you are now offering to sit for:

    (i) ..........................................

11. (i) The value of payment made as Examination fee: ..................................................
(ii) Name of the Bank and the Branch to which the payment was made: ............................
(iii) Number and date of the receipt: ...................................................................

| Affix the receipt here. |
|---|

I state that the particulars given are accurate and I am entitled to sit for the Examination in the medium mentioned in the paragraph 8 above. I certify that I am appearing for the Examination for the first time / I have annexed the Receipt obtained after making the appropriate payment. I agree to be bound by the rules and regulations of the Secretary to Judicial Service Commission regarding conducting of the examination.

................................. ......................................................
Date Signature of the Applicant

---

**Attestation**

I hereby certify that Mr./Mrs./Miss..............................................................................................
..................................................who is a Grade III Court Typist is personally known to me and signed before me on ..................................................

..................................................
Signature of the Registrar

Date: ......................................................
Name: ....................................................
Designation: ..........................................
Address: ...............................................

----------------------------------------------------------------------------------------------------------------

**Certificate of the Head of the Department**

I Certify that,

01. The particulars furnished above were checked and found to be accurate.
02. The officer sits for this Examination for the first time / has made the correct payment as Examination fee.
03. The applicant is eligible to sit for this Examination.

Designation:............................................
Date.........................................................

...........................................................................
Signature of the Head of the Department